**ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**
---------------------------------------------------------

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) දිස්ත්‍රික්කයේ සමස්ථ පරිපාලන කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය

(ආ) දිස්ත්‍රික්කය තුළ මැතිවරණ රාජකාරි මෙහෙයවීම හා අධීක්ෂණය

(ඇ) දිස්ත්‍රික් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම් කටයුතු

(ඈ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දිස්ත්‍රික්කය තුළ අදාල රාජකාරි මෙහෙයවීම හා අධීක්ෂණය

(ඉ) දිස්ත්‍රික්කයේ විශ්‍රාමික ප්‍රජාවට අදාල රාජකාරි කටයුතු

(ඊ) රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික්කය තුළ පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර හා ගිනි අවි බලපත්‍ර නිකුත් කිරිමට අදාල රාජකාරි

(උ) දිස්ත්‍රික්කය තුළ සමාජ සුභසාධන ආපදා කළමනාකරණ හා ආපදා සහන රාජකාරි

(ඌ) දිස්ත්‍රික්කය තුළ කෘෂිකර්ම වාරිමාර්ග හා පරිසර විෂයයන්ට අයත් රාජකාරි

(එ) ජාතික උත්සවයන්ට සමගාමීව දිස්ත්‍රික් හා ප්‍රාදේශිය උත්සව සංවිධානය හා අධික්ෂණය

(ඒ) දිස්ත්‍රික්කය තුළ සංස්කෘතික හා ආගමික කටයුතු ක්‍රියාත්මක කිරිම

(ඔ) දිස්ත්‍රික්කය තුළ අඩු ආදායම්ලාභින්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට අදාල රාජකාරි

## 1:2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

| | | | |
|---|---|---|---|
| (අ) | කළුතර | (ඌ) | මතුගම |
| (ආ) | පානදුර | (එ) | අගලවත්ත |
| (ඇ) | බණ්ඩාරගම | (ඒ) | වලල්ලාවිට |
| (ඈ) | හොරණ | (ඔ) | පාලින්දනුවර |
| (ඉ) | බුලත්සිංහල | (ඕ) | මදුරාවල |
| (ඊ) | දොඩන්ගොඩ | (ක) | මිල්ලනිය |
| (උ) | බේරුවල | (ග) | ඉංගිරිය |

**1:3 විගණන විෂය පථය**

---------------------

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 07 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1:4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණ**

---------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.706,973,341 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.699,158,355 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු: 7,814,806 ක් හෙවත් සියයට එකක් ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 646,373,341 | 639,107,228 | 7,266,113 | 1 |
| මූලධන | 60,600,000 | 60,051,307 | 548,693 | 1 |
| **එකතුව** | **706,973,341** | **699,158,535** | **7,814,806** | **1** |

(ii) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 24 කින් හා දෙපාර්තමේන්තු 18ක් විසින් එකතුව රු.2,743,491,434 ක්වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.970,796,815 ක් හා රු.1,757,481,110 ක් වශයෙන් එකතුව රු.2,728,277,925 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.2,541,828 ක් හා රු.12,671,681ක් වශයෙන් එකතුව රු.15,213,509 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරියන් ලබා දී තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 0.26 ත් සියයට 0.72 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | **රු:** | **රු:** | **රු:** | **රු:** | **රු:** | **රු:** |
| 25701 | 70,000,000 | 51,206,635 | 38,000,000 | 62,418,028 | 265,000,000 | 198,848,445 |

## 1.6 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඌනතා ලෙස සඳහන් ඩී.වී.ඩී. යන්ත්‍රය හා සෝනි රූපවාහිනී යන්ත්‍රය පිළිබඳ මුදල් රෙගුලාසි 102 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර 2013 වර්ෂයට අදාල විසර්ජන ගිණුමේද එම අලාභය ඇතුළත් කර නොතිබුණි.

## 1.7 අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) **නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් කළ නියැදි පරීක්ෂණයකදී 2009 ජනවාරි 01 දිනැති අංක 1/2009 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව ආබාධිත අනත්දරු සඳහා නිසි රැකවරණය ලැබෙන බවට ග්‍රාම නිලධාරී විසින් මාසික වාර්තාවක් ගොනුවට ඇතුළත් කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි.

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

**-------------------------------------**

2013 අංක 17 දරන එකතු කළ අගය මත බදු සංශෝධන පනත පරිදි එකතු කළ අගය මත බදු සඳහා අදාල නොවන පෞද්ගලික ආයතනයක් වෙත 2013 ජනවාරි සිට මාර්තු දක්වා එකතුව රු.33,104 ක් එකතු කළ අගය මත බදු ලෙස ගෙවා තිබුණි. මෙම මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 1.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

**------------------------------------------**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව කළ විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) මුදල් නිදහස් කර තිබුණද ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

**--------------------------------------------------------------**

මුදල් නිදහස් කර තිබුණත්, ප්‍රගතියක් ලබා නොතිබුණු පහත සඳහන් ව්‍යාපෘති විගණනයේදී නිරීක්ෂණය විය.

(i) දිවි නැගුම ධීවර පසු අස්වනු තාක්ෂණ ව්‍යාපෘතිය යටතේ උම්බලකඩ නිෂ්පාදනය සඳහා උම්බලකඩ උදුන් ලබා දීම වෙනුවෙන් බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.320,000 ක ප්‍රතිපාදන 2013 අප්‍රේල් 18 දින ලබා දී තිබුණි. මේ පිළිබඳව සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී උදුනෙහි වියලීමට හැකිව තිබුණේ මාළු කිලෝ 5ක පමණ ප්‍රමාණයක් බැවින් උදුන ප්‍රමාණවත් නොවන බව ප්‍රතිලාභීන්ගේ අදහස වූ අතර කුඩා ප්‍රමාණවලින් මාළු මිලදී ගැනීමේදී ඉහල මිලකට මිලදී ගත යුතු බවත්, ඒ නිසා උම්බලකඩ වියලීම ලාභදායි නොවන බවත් ප්‍රකාශ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණ දැනුම ලබා දීම සම්බන්ධයෙන් පසු විපරමක් සිදුවී නොතිබුණි. දිවි නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී ඇත්තේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත බැවින් මේ පිළිබද පසු විපරම් කිරීම ග්‍රාම සේවක කොට්ඨාශ මට්ටමෙන් පත් කර ඇති සංවර්ධන නිලධාරීන්ගේ වගකීමක් වි තිබුණි. මෙම උදුන් භාවිතා නොකර අතහැර දැමු අවස්ථාද අනාවරණය විය.

(ii) දිවි නැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභි පවුල් 40 ක් සඳහා රු.107,200 ක් වටිනා කුකුළු පැටව් 400 ක් හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2013 ඔක්තෝබර් 15 දින බෙදාහැර තිබුණි. 2014 පෙබරවාරි මාසය සඳහා වූ පසු විපරම් වාර්තාව අනුව මාස 04 ක් ඉක්මයාමට පෙර මින් කුකුළු පැටව් 83 ක් මිය ගොස් තිබුණි.

1.9 **බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**-----------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් 2013 වර්ෂයේ ලියන ලද රු 82,000 ක් වු චෙක්පත් 02 ක් අදාල ආයතන හෝ පුද්ගලයන් වෙත 2014 අප්‍රේල් 23 දින වන විටත් භාර දීමෙන් තොරව කාර්යාලයේ තබා තිබුණි.

(ආ) 2014 මාර්තු 31 දිනට සකස් කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2013 වර්ෂයේ නිකුත් කළ රු.1,056,005 ක් වූ චෙක්පත් 48 ක් උපලබ්ධි වී නොතිබුණු අතර එම චෙක්පත්වලින් වැඩි චෙක්පත් ප්‍රමාණයක් දින දීර්ඝ කිරිම්, නැවත හිලව් චෙක්පත් නිකුත් කිරීම් විය.

1.10 **මත භේදයට තුඩු දෙන ගනුදෙනු**

**---------------------------------**

2012 ගම නැගුම වැඩසටහන යටතේ දියගම 4 කණුව ගහබඩ පාරට පානීය ජලය ලබාදීම සඳහා රු.1,000,000 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජල පවහන මණ්ඩලය වෙත 2012 මැයි 23 දින ගෙවා තිබුණි. ජලනල එලනු ලබන මාර්ගයේ දිග හා එක් එක් වැය විෂය යටතේ වැය වන වියදම, ජල නල සනත්වය ආදි ලෙස සකස් කරන ලද ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී නොමැති අතර ජාතික ජල සම්පාදන හා ජල පවහන මණ්ඩලය විසින් එම මුදලින් රු.107,143 ක් අඩු කොට රු.852,857 ක මුදලක් පමණක් 2014 අප්‍රේල් 21 දින කළුතර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ආපසු ලබා දී තිබුණි. එම මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. ඒ අනුව නිසි පරිදි සැලැසුම් සකස් නොකිරිම නිසා අදාල ව්‍යාපෘතිය ඉටු කර ගැනිමට නොහැකි වී තිබුණි. එමෙන්ම රජයේ මුදල් වර්ෂ 2 ක පමණ කාලයක් නිෂ්කාර්යව වෙනත් ආයතනයක රඳවා තැබිමට ඉඩ දි තිබුණු අතර, රු.107,143 ක නිෂ්ඵල වැයක්ද කර තිබුණි.

1.11 **කළමණාකරන දුර්වලතා**

**-------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව සමාලෝචිත වර්ෂයේ ජනාධිපති අරමුදලින් රෝගීන් 12ක් වෙනුවෙන් ආධාර ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර තිබුණ ද තොරතුරු ලබා දීම ප්‍රමාදවීම හේතුවෙන් හෘදයාබාධ හා සැත්කම් සඳහා ආධාර ලබා දීම ප්‍රමාද වී තිබුණි.

(ආ) සමාජ සේවා අමාත්‍යාංශයේ ආබාධ සහිත තැනැත්තන් සඳහා වු ජාතික මහ ලේකම් කාර්යාලය මගින් මෙහෙය වන ආබාධිත නිවාස ආධාර ලබා දිමේ වැඩසටහන යටතේ 2009, 2011 හා 2013 වර්ෂවල ආධාර ඉල්ලුම් කළ ආධාර ලාභීන් 4 දෙනෙක් සඳහා රු.700,000 ක මුදලක් අනුමත කර

තිබුණි. එක් එක් වර්ෂය තුළ කොටස් වශයෙන් ගෙවූ ආධාර මුදල රු.420,000 ක් විය. ඉතිරි මුදල් විගණන දිනය වූ 2014 මැයි 12 දින වන විටත් ගෙවා නොතිබුණි. 2012 වර්ෂයේ සිට ආධාර ඉල්ලුම් කළ අයදුම්කරුවන් 5 දෙනෙකු සම්බන්ධයෙන් විගණන දින වන විටත් ආධාර ලබා දී නොතිබුණි. ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර මුදල් ලබා දීමේ දී අවශ්‍ය වාර්තා ,ගිවිසුම් ඇතුළත් කොට ලිපි ගොනු යාවත්කාලීන කර නොතිබුණි.

1.12 **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 49 | 48 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 34 | 26 | 08 |
| (iii) | ද්විතීක මට්ටම | 1,315 | 1,039 | 276 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 154 | 149 | 05 |
| | **එකතුව** | **1,552** | **1,262** | **290** |

විගණන දිනය වූ 2014 ජුනි 15 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල සමස්ථ සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණි.